# අසීසියේ ෆ්‍රැන්සිස් තුමාගේ දේවධාර්මික සංකල්ප නාසරතයේ ජේසු තුමන්ගේ ධර්මය සමඟ තුලනාත්මක ව විමසීමක්

ආර්. එම්. සචිනි ධනුෂ්කා රත්නායක[1]

මධ්‍යකාලීන යුරෝපයේ ආරම්භ වූ යාචක හෙවත් ෆ්‍රැන්සිස්කානු නිකායේ නිර්මාතෘ, අසීසියේ ෆ්‍රැන්සිස් තුමාගේ දේවධාර්මික සංකල්ප නාසරතයේ ජේසු තුමන්ගේ ධර්මය සමඟ තුලනාත්මක ව විමසීම මේ අධ්‍යයනයේ මූලික අන්තර්ගතය යි. මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ අසීසියේ ෆ්‍රැන්සිස් තුමන්ගේ ක්‍රිස්තු කේන්ද්‍රීය හා මානව විමුක්ති දේවධාර්මික දැක්ම නාසරතයේ ජේසු තුමන්ගේ ධර්ම චින්තනය හා සමීප වීමේ දී මධ්‍යකාලීන යුගයේ පැවති කිතුනු සභා නායකත්වයෙන් පැමිණි අර්බුද කවරේ ද යන්න විමසීම යි. මේ ගැටලුව මුල් කොටගෙන අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වන ප්‍රධාන අරමුණු දෙකකි. එනම් අසීසියේ ෆ්‍රැන්සිස් තුමන් තම දේවධාර්මික සංකල්ප සඳහා කෙතෙක් දුරට ජේසු තුමන්ගේ ධර්ම චින්තනය ගුරු කොටගත්තේ ද හා නව නිකායයක් ලෙස නිල කිතුනු සභාව සමඟ සම්බන්ධ වීමේ දී එතුමන් මුහුණ පෑ අර්බුදය ජය ගත්තේ කෙසේ ද යන්න විමසීම යි. නිබන්ධනයට අදාළ දත්ත රැස් කරගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේදය වන්නේ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි ආශ්‍රයෙන් දත්ත ලබාගැනීම යි. තෝරාගත් ප්‍රධාන මාතෘකාවන්ට අදාළ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි අධ්‍යයනය කරමින් ඒවායේ කරුණු විශ්ලේෂණය කරමින් මේ අධ්‍යයනය සඳහා තොරතුරු රැස් කෙරිණි.

**ප්‍රමුඛ පදඃ** ෆ්‍රැන්සිස්කානු නිකායය, අසීසියේ ෆ්‍රැන්සිස් තුමා, නාසරතයේ ජේසු තුමා, ධර්ම චින්තනය

[1] බටහිර සම්භාව්‍ය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය